# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**07 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය 5 - අම්ල හා භෂ්ම**

NALANDA COLLEGE NALANDA COLLEGE NALANDA COLLEGE

## A කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) නිල් ලිට්මස් රතු පැහැයට හරවන ද්‍රව්‍ය කුමන නමකින් හැඳින්වේද ?
1) භෂ්ම 2) අම්ල 3) ලවන 4) උදාසීන

02) රතු ලිට්මස් රතු පැහැයට හරවන ද්‍රව්‍ය කුමන නමකින් හැඳින්වේද ?
1) භෂ්ම 2) අම්ල 3) ලවන 4) උදාසීන

03) ප්‍රබල අම්ලයකි,
1) පොටෑසියම් පර්මැංගනේට් 2) පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ්
3) නයිට්‍රික් 4) ඇමෝනියා

04) මෙතිල් ඔරේන්ජ් අම්ල සමග ලබාදෙන වර්ණය වන්නේ,
1) රතු 2) කහ 3) අවර්ණ 4) රෝස

05) පහත සඳහන් ඒවායින් උදාසීන ද්‍රව්‍ය කුමක්ද ?
1) නාරං 2) ලුණු 3) සබන් 4) අළු

06) බඩේ ආම්ලිකතාවය අඩු කිරීමට ප්‍රතිකාරයකි,
1) දෙහි යුෂ පානය කිරීම. 2) වමනය කිරීම.
3) මිල්ක් ඔෆ් මැග්නීෂියා පානය කිරීම. 4) ජලය වැඩිපුර පානය කිරීම.

## B කොටස

♣ **හිස්තැන්වලට අදාල පිළිතුර ලියන්න.**

1) a) අම්ල ........................................................ ලිට්මස් ........................................................ හරවයි.

b) භෂ්ම ........................................................ ලිට්මස් ........................................................ හරවයි.

c) නිල් හෝ රතු ලිට්මස් වල වර්ණ වෙනසක් සිදු නොකරන ද්‍රව්‍ය .............................. ලෙස හඳුන්වයි.

2) පහත සඳහන් ද්‍රාවණ ඔබට සපයා ඇත. (විනාකිරි, හුණුදියර)

a) නිල් ලිට්මස් රතු පාටට හරවන දියරය කුමක්ද ?

b) රතු ලිට්මස් නිල් පාටට හරවන දියරය කුමක්ද ?

3) a) දර්ශක යනු මොනවාද ?

b) විද්‍යාගාරයේදී ඔබට හමුවන දර්ශක 3 ක් නම් කරන්න.

c) නිවසේදී ඔබට සාදාගත හැකි දර්ශක 3 ක් නම් කරන්න.

4)

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | | | B | | | | | C | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |

අම්ල, භෂ්ම හා උදාසීන ද්‍රව්‍ය හඳුනා ගැනීමට යොදා ගන්නා pH කඩදාසියක අංක යොදා ඇති ආකාරය මෙහි දැක්වේ.

i) A, B හා C සඳහා ගැලපෙන ද්‍රාවණ පහත ඒවායින් තෝරන්න.

(සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය, දෙහි යුෂ, ලුණු ද්‍රාවණය, සබන් දියර, පොල්තෙල්, විනාකිරි)